# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2112/47 - 2019 මාර්තු මස 01 වැනි සිකුරාදා - 2019.03.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

### මධ්‍යම පළාතේ පළාත් සභාව

### මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයා විසින් සිදුකරනු ලබන නිවේදන

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154(ඇ) වගන්තිය යටතේ මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර මෛත්‍රී ගුණරත්න වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වහාම ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් මධ්‍යම පළාත් අමාත්‍යාංශවල විෂයයන් සංශෝධනය කිරීමට කටයුතු සිදුකරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| *අනු අංකය* | *සංශෝධනයට පෙර පැවති පළාත් අමාත්‍යාංශ විෂයයන්* | *සංශෝධනය කිරීමෙන් පසු පළාත් අමාත්‍යාංශ විෂයයන්* |
|---|---|---|
| 01 | මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යාංශය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, සංචාරක, ඉඩම්, සමූපකාර සංවර්ධන, වෙළඳ හා වාණිජ, ආහාර සැපයුම් හා බෙදාහැරීමේ කටයුතු, පරිසර කටයුතු සහ ආයෝජන සම්බන්ධීකරණ, වෙනත් අමාත්‍යාංශයන් යටතට නොගැනෙන විෂයයන් සම්බන්ධ අමාත්‍යාංශය. | මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යාංශය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, ඉඩම්, සමූපකාර සංවර්ධන, වෙළඳ හා වාණිජ, ආහාර සැපයුම් හා බෙදාහැරීමේ කටයුතු, ක්‍රීඩා සහ ආයෝජන සම්බන්ධීකරණ, වෙනත් අමාත්‍යාංශයන් යටතට නොගැනෙන විෂයයන් සම්බන්ධ අමාත්‍යාංශය. |
| 02 | මධ්‍යම පළාත් ක්‍රීඩා, යෞවන කටයුතු, වනිතා, ග්‍රාමීය සංවර්ධන හා කර්මාන්ත අමාත්‍යාංශය | මධ්‍යම පළාත් යෞවන කටයුතු, වනිතා, ග්‍රාමීය සංවර්ධන, සංචාරක හා කර්මාන්ත අමාත්‍යාංශය. |
| 03 | මධ්‍යම පළාතේ කෘෂිකර්ම, සුළු වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, ගොවිජන සංවර්ධන මිරිදිය ධීවර, හින්දු සංස්කෘතික, ද්‍රවිඩ අධ්‍යාපන (මුස්ලිම් පාසල් හැර) සහ වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය. | මධ්‍යම පළාතේ කෘෂිකර්ම, සුළු වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, ගොවිජන සංවර්ධන, මිරිදිය ධීවර, පරිසර කටයුතු, හින්දු සංස්කෘතික, ද්‍රවිඩ අධ්‍යාපන (මුස්ලිම් පාසල් හැර) සහ වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය. |

මෛත්‍රී ගුණරත්න,<br>
ජනාධිපති නීතිඥ,<br>
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර.


1A - G 29381 — 27 (2019/03)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*